# විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව




13

හැමදාම හොරුන්ට රට බාර දීලා පැත්තකට වෙලා ඉන්න බැහැ.. අපි හොඳ මිනිස්සු ඉස්සරහට ගන්න ඕනෙ.. හොර නඩ පස්සෙ දුවන එක නතර කරලා අවංක මිනිස්සුන්ට තැන දෙන්න ඕනෙ...

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

"කිසිම අහංකාරකමක් නැති මහත්තයෙක්.." දොස්තර මේනක ගිය පසු තාත්තා කිවේ ය. අම්මාද එය අනුමත කළා ය. මේනක ගියේ අම්මා ඔහු වෙනුවෙන් කඩිමුඩියේ සකස් කළ දිවා ආහාරයද ගැනීමෙන් පසුවය. ඒ ගැනද අම්මාගේ සිතේ විශාල සතුටක් තිබුණි. අම්මාත් තාත්තාත් සිටින්නේ සඟවාගත් සතුටකින් බව ස්නේහාට දැනෙයි. එහෙත් ඇය සිටියේ ව්‍යාකූල වූ මනසකිනි. දොස්තර මේනකගේ පැමිනීම පවා ඇගේ සිත තුළ බරක් ඇති කර තිබුණි.

"ඔහු පැමිණියේ ඇයි? ඒ ගමනේ අරමුණ කුමක් වීද? තමා වෙනුවෙන් රැකියාවක් සොයා දෙන්නට ඔහු මේ හැටි මහන්සිවන්නේ ඇයි?" මේ සියලු ප්‍රශ්න ස්නේහාගේ සිතට වද දුන්නේ ය.

"කල්පනා කරලා මට කෝල් එකක් දෙන්න.. ඒ අය මං වෙනුවෙන් මේ වේකන්සි එක ටික දවසක් තියාගෙන ඉඳියි" මේනක යන්නට පෙර කීවේ ය. ස්නේහා කෘතඥතාව පළකරන සිනාවක් පෑවා මිස යමක් නොකීවා ය.

සතියකට දෙකකට වතාවක් නොවරදවා ලැබෙන බඩු පෙට්ටි දැන් ඇයට දැන් මහත් වදයක් වී තිබෙයි. ඒ සමහර පෙට්ටි විවෘත කරන්නේවත් නැතිව කාමරයක ගොඩ ගසා ඇත. තවත් සමහර පෙට්ටි වල තිබූ විවිධාකාර කෑමවර්ග පොඩිවුන් අනවසරයෙන්ම තමන් සන්තක කරගෙන සිටිති. එවන්නේ කවුදැයි ස්නේහා නොදැන සිටියද ගෙදර අය සිතන්නේ ඒවා ඇය සේවය කළ තැනින් එවනවා කියා ය. එය වැරදි අවබෝධයක් යයි තේරුම් කර දෙන්නට ඈ නොවෙහෙසුණා ය.

දොස්තර මේනක ගේ ගමනින් පසු ඉසුර සිටින්නේ අසතුටින් යයි ස්නේහාට දැනුණි. ඔහු සගවාගන්නට කොයි තරම් උත්සාහ කළත් ඒ කණගාටුව වරින් වර ඇයට තේරුම් ගන්නට හැකි වෙයි.

"දොස්තර මහත්තුරු එක්ක අපට හැරෙන්නවත් පුලුවන්ද?" ඔහු වරක් ඇයට ඇසෙන්නට කීවේ ය. ඈ සිනාසුණා ය. "..දොස්තර කෙනෙක් කියන්නෙ සල්ලි කන්දක්..?" ඔහු නැවත කීවේ ය.

"සල්ලි වලට හැමදේම කරන්න බැහැ අයියෙ.." ස්නේහා කීවේ ඇත්තටම සිතුණ දේ ය. ".. අනෙක් මිනිස්සු ගැන වද වෙවී ඉන්නැතුව ඔයාගෙ වැඩ ටික කරගෙන යන්න.. හැමෝටම වෙන් වෙච්ච වැඩක් තියෙනවා... ඒ හැම වැඩක්ම සමාජයට වැදගත්.. ඔයාට වෙන් වෙච්ච වැඩකුත් තියෙනවා... ඔයාට යන්න වෙනම ගමනක් තියෙනව කියන එක හිතාගෙන ඉස්සරහට යන්න.."

ඔහු ඇගේ කතාවට සිනාසුණේ ය. ඇගේ බලකිරීම නිසාම ඔහු දිග ගමනක් යන්නට තරයේ අදිටන් කරගෙන තිබුණි. පළාත්පාලන ඡන්දය වෙනුවෙන් ස්වාධීන කණ්ඩායමක් සූදානම් කරන්නටත් ඔහු කටයුතු යොදා තිබුණි. ලොකු හාමුදුරුවන්ගේ ආශිර්වාදය මැද ඔහු ඒ කණ්ඩායමේ නායකත්වය ගෙන තිබුණි. සිය කන්ඩායමේ නාම යෝජනා බර දුන් දිනයේ ඔහු කෙළින්ම පැමිණියේ ස්නේහා සොයාගෙන ය. එය සුබ දිනයකි. එනිසාම ඈ මව සමග එක් වී කිරිබතක් සාදා තිබුණි. තාත්තා වත්තෙන් හොඳින් ඉදුණු කෝලිකුට්ටු කැනක් කපා ගෙනැවිත් තිබුණි.

"ඔන්න අපේ අනාගත මන්ත්‍රීතුමාට අපේ දුප්පත් ගෙදරින් කිරිබත් සංග්‍රහයක්" ස්නේහා කීවේ ඔහුට කිරිබත් බෙදන ගමන් ය.

"අපි දිනයිද?" ඔහු ඇසුවේ ය.

"දෙගිඩියාවෙන් සටනට බහින්න එපා අයියේ.. අනිවාර්යයයෙන්ම දිනනවා" ඈ ස්ථිරව කීවා ය. "..ඔයා මේ ගමට කළ සේවය වෙනුවෙන් මේ ගමේ මිනිස්සු ඔයාට ඡන්දෙ දෙන්නැත්නම් ඉතින් ඉර අනිත් පැත්තෙන් පායන්න ඕනෙ"

ඔහු නැවතත් තනිවම සිනාසුණේ ය.

"ඇයි හිනාවෙන්නෙ?" ඈ ඇසුවා ය. "මං බොරුද කිව්වෙ?"

"නෑ.. ඇත්ත.. ලොකු හාමුදුරුවො කිව්වෙත් ඔය කතාවම තමයි" ඔහු කීවේ ය.

"ඒක තමයි ඇත්ත .. මේ ලෝකෙ ඉඳ හිට හරි හොඳ දේවලුත් වෙන්න ඕනෙ ඉසුරයියෙ.. හැමදාම හොරුන්ට රට බාර දීලා පැත්තකට වෙලා ඉන්න බැහැ.. අපි හොඳ මිනිස්සු ඉස්



සරහට ගන්න ඕනෙ.. ඇස් අන්ධකරගෙන හොර නඩ පස්සෙ දුවන එක නතර කරලා අවංක මිනිස්සුන්ට තැන දෙන්න ඕනෙ..."
"ඒක වේවිද ස්නේහා?"

"ඒක වෙනව අයියෙ.. අද නැත්නම් හෙට හරි ඒක වෙනවා" ඈ ස්තිර හඬින් කීවා ය. "බලාපොරොත්තු නැතිකරගන්න එපා කොයිම වෙලාවකවත්.. ඒ දවස එනවාමයි.. ඒ දවස එනකල් කරගෙන යන වැඩ ටික කිසිම අඩුවක් නැතිව කරගෙන යන්න.. කිසිම තැනකදි මොනම බහේතුවක් නිසාවත් ආපහු හැරෙන්න එපා.. ඉස්සරහටම යන්න.."

"මං තනිවමද ඒ ගමන යන්න ඕනෙ? ඔහු ඇසුවේ අම්මාත් තාත්තාත් ළඟපාතක නැති බව සැක හැර දැනගැනීමෙන් පසුව ය.

**මතු සම්බන්ධයි**